**ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය- 2012**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2012 දෙසැම්බර් 31 දිනට ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**1.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2012 ජනවාරි 01 දිනට සම්පූර්ණයෙන් ක්ෂය කර අවසන් වී තිබුණු ගත්මිල රු.26,393,112 ක් වූ දේපල පිරියත හා උපකරණ 2012 වර්ෂය තුළ දී ද විශ්වවිද්‍යාලීය කටයුතු සඳහා කාර්යක්ෂම ලෙස භාවිතා කර තිබුණි. එම වත්කම් ශ්‍රීලගිප්‍ර 16 අනුව ප්‍රත්‍යාගණනය කර ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 19 අනුව සේවක පාරිතෝෂික දීමනා වෙනුවෙන් වෙන්කරන ලද වටිනාකම ආයෝජනය කළයුතු වුවත්, 2012 දෙසැම්බර් 31 දිනට පාරිතෝෂික වෙන් කිරීම් රු.45,375,255 ක් ආයෝජනය කිරීමට කටයුතු කර නොතිබුණි.

**1.2.2 ගිණුම්කරණ අඩුපාඩු**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ) අඩුවෙන් හා වැඩියෙන් දැක්වීම්**

2010 වර්ෂයේ සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවට ප්‍රතිපූර්ණය කළ යුතු කැඩෙට් නිලධාරීන්ගේ වැටුප් රු.150,547,914 ක් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ උපචිත වියදම් ලෙස පෙන්වා නොතිබුණු බැවින් වර්ෂයේ වියදම් හා බැරකම් එම ප්‍රමාණයෙන්

අඩුවෙන් දක්වා තිබුණි. ශ්‍රී ලංකා යුද්ධ හමුදාව විසින් මෙම මුදල කපා හැරීමට එකඟවී ඇති බවට උපකුලපති විගණනයට දැනුම්දී තිබුණි.

**(ආ) අනුචිත හෙළිදරව් කිරීම්**

බැංකු ණය ගිණුමේ ශේෂය වූ රු.47,802,500 ක අගයෙන් 2013 වර්ෂයේදී පියවිය යුතු බැංකු ණය ප්‍රමාණය ජංගම වගකීම් යටතේ දක්වා ඉතිරිය ජංගම නොවන වගකීම් ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දැක්විය යුතු වුවත් විශ්වවිද්‍යාලය උක්ත ණය ගිණුමේ මුළු ශේෂය මූල්‍ය ප්‍රකාශනවල ජංගම වගකීම් ලෙස දක්වා තිබුණි.

### 1.2.3 විගණනය සඳහා සාක්ෂි නොවීම

2011 වර්ෂයේ සිට "කෙරීගෙන යන වැඩ " යටතේ දක්වා ඇති පහත විස්තර සඳහන් ඉදිකිරීම්වල වටිනාකම 2012 දෙසැම්බර් 31 දින වන විටත් නොවෙනස්ව පැවතුණි.

| ගිණුම් ශේෂය | 2011 දෙසැම්බර් 31 දිනට හා 2012 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|
| | රු. |
| ගොඩනැගිලි | 6,388,934 |
| විවාහක නිල නිවාස | 230,870 |
| විවාහක නිල නිවාස ඉදිකිරීම් | 5,033,574 |

මෙම වටිනාකම හඳුනා ගැනීමට අවශ්‍ය සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවීය.

### 1.2.4 නීති, රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

විගණනයේදී පහත දැක්වෙන අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය-2006 | |
| (i) 2.14.1,3.4.1හා4.3 මාර්ගෝපදේශයන් | දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ අධිකාර සීමාව රු.මිලියන 3 ක් වුවද, එකී සීමාව ඉක්මවා ප්‍රසම්පාදන සිදුකර තිබුණු අතර එම ප්‍රසම්පාදන |

කමිටුව විසින් තොරාගත් කොන්ත්‍රාත්කරුවන්ට ගෙවීම් කර තිබුණත්, ඒ සඳහා පිරිවැය ඇස්තමේන්තු පිළියෙල කර නොතිබුණි.

- වෛද්‍ය පීඨ ගොඩනැගිල්ල සඳහා රු.මිලියන 9.1 ක් වටිනා ගිණි ආරක්ෂණ පද්ධතියක් සපයා සවිකිරීම හා ඒ සඳහා රු.4,596,547 ක් වැය කිරීම.
- වෛද්‍ය පීඨ ගොඩනැගිල්ල සඳහා රු.මිලියන 7.1 ක් වටිනා විදුලි සෝපානයක් සපයා සවිකිරීම හා ඒ සඳහා රු.3,584,000 ක් වැය කිරීම.
- වෛද්‍ය පීඨ ගොඩනැගිල්ල සඳහා රු.මිලියන 4.7 ක් වටිනා කාපට් ඇතිරීම හා ඒ සඳහා රු.742,834 ක් වැය කිරීම.
- සේවක දිරිදීමනා සඳහා රු.මිලියන 12.4 ක වියළි සලාක මිලට ගැනීම.

| | | |
|---|---|---|
| (ii) | 5.4.4 (i) මාර්ගෝපදේශය | මිලදී ගැනීම් අත්තිකාරම් ලබාදීමේ දී පිළිගත හැකි ගෙවීම් සුරක්ෂණයක් ලබාගත යුතු වුවත්, එපරිදි සුරක්ෂණයක් ලබානොගෙන අවස්ථා 08 කදී රු.20,437,428 ක් සැපයුම්කරුවන් වෙත අත්තිකාරම් ලෙස ගෙවා තිබුණි. එම ප්‍රමාණය එක් එක් මිලදී ගැනීමේ වටිනාකමින් සියයට 50 සිට සියයට 100 දක්වා වූ බව නිරීක්ෂණය විය. |
| (iii) | 8.9.1 (ආ) මාර්ගෝපදේශය | වටිනාකම රු.500,000 ක් ඉක්මවන භාණ්ඩ හා සේවා ප්‍රසම්පාදනයේ දී ආයතන හයකට අදාල එකතුව රු.28,813,494 ක් වටිනා භාණ්ඩ හා සේවා සැපයීම සඳහා අදාල පාර්ශව සමඟ එළඹ ඇති ලිඛිත ගිවිසුම් විගණනයට ඉදිරිපත් නොකෙරුණි. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය විසින් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රතිඵලය රු.36,566,608 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.20,889,023 ක

අතිරික්තයක් වුයෙන් ඉකුත් වර්ෂය හා සැසඳීමේදී රු.15,677,585 ක මූල්‍ය ප්‍රතිඵලවල වර්ධනයක් පෙන්නුම් කරයි. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මුල්‍ය ප්‍රතිඵලයෙහි වර්ධනයක් පෙන්නුම් කරනුයේ සමාලෝචිත වර්ෂයේදී ආදායම් ඉහල යාම බව නිරීක්ෂණය විය.

**2.2 ආයතනයට එරෙහිව හෝ ආයතනය විසින් ආරම්භ කර ඇති නෛතික සිද්ධි**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) බාහිර පුද්ගලයන් තිදෙනෙකු විසින් විශ්වවිද්‍යාලයේ දේපලවලට උරුමකම් දක්වමින් විශ්වවිද්‍යාලයට එරෙහිව අධිකරණවල නඩු තුනක් ගොනුකර තිබුණි.

(ආ) විශ්වවිද්‍යාලය විසින් ශිෂ්‍යභාවය අහෝසි කරනු ලැබූ කැඩෙට් නිලධාරින් බඳවාගැනීමේදී අයකර ගනු ලැබූ ඇප බැඳුම්කර අයකර ගැනීම සඳහා පුද්ගලයින් අට දෙනෙකුට එරෙහිව එකතුව රු.3,050,000 ක වන්දි ඉල්ලා අධිකරණවල නඩු අටක් ගොනුකර තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කාර්ය සාධනය**

යටිතල පහසුකම් සංවර්ධනය යටතේ 2012 වර්ෂයේ දී ක්‍රියාත්මක කරන බවට සංයුක්ත සැලැස්මෙහි දක්වා තිබූ පහත සඳහන් කාර්යයන් සමාලෝචිත වර්ෂය තුළ ඉටුකිරීමට කටයුතු කර නොතිබුණි.

(අ) පශ්චාත් උපාධි අධ්‍යයන අංශය සඳහා වෙනම ගොඩනැගිලි සංකීර්ණයක් ඉදිකිරීම.

(ආ) ඉංජිනේරු පීඨය සඳහා සය මහල් විද්‍යාගාරයක් ඉදිකිරීම.

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

භාණ්ඩ හා සේවා ප්‍රසම්පාදනයේ දී අවශ්‍ය භාණ්ඩ හා සේවා ඉක්මනින් හා කාර්යක්ෂමව ලබාගැනීම සඳහා චක්‍රලේඛ ප්‍රතිපාදන අභිබවා මිලදී ගැනීම් සඳහා සියයට 100 ක් අත්තිකාරම් ලබා දී තිබුණි. 2011 වර්ෂයේදී ලබාදී තිබූ අත්තිකාරම්වලට අදාල භාණ්ඩ 2013 සැප්තැම්බර් මාසය දක්වාම සපයා නොතිබුණු අවස්ථා නිරීක්ෂණය විය. එම මුදල් ආපසු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණු අතර එම සැපයුම්කරුවන් වෙත තවදුරටත් අත්තිකාරම් මුදල් ලබා දී තිබුණි. 2011 හා 2012 වර්ෂවලදී ඉහත පරිදි ලබාදුන් අත්තිකාරම් වලින් පිළිවෙලින් රු.37,300 ක් හා රු.5,045,201 ක් තවදුරටත් පියවා නොතිබුණි.

**3.3 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

2011 හා 2012 වර්ෂවල දී මිලදී ගැනීම් සඳහා අත්තිකාරම් වශයෙන් සැපයුම්කරුවන් වෙත ලබාදී තිබුණු පිළිවෙලින් රු.8,347,144 ක් සහ රු.40,918,417 ක් 2012 දෙසැම්බර් 31 දින වන විටත් නිරවුල් කර නොතිබුණි.

**3.4 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වෛද්‍ය පීඨ ගොඩනැගිල්ලේ ගොඩනැගිලි අංක 03 හි සවිකර තිබූ පහත අයිතමයන් ගොඩනැගිල්ල පාවිච්චියට ගෙන වසරක් ගත වීමට පෙර මල බැඳී තිබුණි.

| | | |
|---|---|---|
| (i) | Fire Doors | 20 |
| (ii) | සනීපාරක්ෂක උපකරණ | 04 |

(ආ) ඉහත ගොඩනැගිල්ලේ තරප්පු පෙළෙහි අත්වැට හා පිටත ආරක්ෂිත වැටවල් යකඩ භාවිතා කර ගැල්වනයිස් ආලේප කර නිමකර තිබුණ ද පරීක්ෂණ අවස්ථාව වන විට මල බැඳී තිබුණි.

**4. පද්ධති හා පාලනයන්**

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු පිළිබඳව වරින්වර විශ්වවිද්‍යාලයේ උපකුලපතිවරයා දැනුවත් කරන ලදී. පහත දැක්වෙන පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතු වේ.

(අ) ගිණුම්කරණය.

(ආ) අයවැය පාලනය.

(ඇ) අත්තිකාරම් පාලනය.

(ඈ) වත්කම් පාලනය.

(ඉ) ඉදිකිරීම් පාලනය.